**උත්තරානන්ද මාවත සහ කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථාන අසල දුම්රිය මාර්ගයට ඉහළින් ගුවන් පාලම් ඉදිකිරීම ව්‍යාපෘතිය - 2021**

උත්තරානන්ද මාවත සහ කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථාන අසල දුම්රිය මාර්ගයට ඉහළින් ගුවන් පාලම් ඉදිකිරීම ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී උත්තරානන්ද මාවතේ සහ විනිසුරු අක්බර් මාවතේ ශ්‍රේණිගත හරස් මාර්ගවල රථවාහන තදබදය අවම කිරීම සඳහා ඒකාබද්ධ රථවාහන කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම සහ කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ බාලදක්ෂ මාවත, ශ්‍රී මොහොමඩ් මාකන් මාකර් මාවත, ශ්‍රී ජේම්ස් පීරිස් මාවත (ඒ 004 පාර), මැලේ වීදිය, පල්ලිය පාර සහ අනෙකුත් මාර්ගවල සංචලනය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන 9,133.25 ක් වූ අතර මුළු පිරිවැය ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2021 ජුනි 16 දින ආරම්භ කර තිබුණු අතර 2022 ජුනි 15 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු රු. මිලියන 344.2 ක මුදලක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ, අරමුදල් වෙනස්වීම් ප්‍රකාශයේ සහ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු අරමුදල් ලෙස නොපෙන්වා ණය ගැනීම් ලෙස දක්වා තිබුණි. | 2022 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු අරමුදල් ලෙස නිවැරදි කිරීමට සටහන් කර ඇත. | සියලුම අරමුදල් ප්‍රභවයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුකූලව සටහන් කිරීම අවශ්‍ය වනු ඇත. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| අංකය | සංරචකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ගුවන් පාලම් ඉදිකිරීම | කොන්ත්‍රාත් පැකේජ 1 සහ 2 හි ඉදිකිරීම් පිළිවෙළින් 2022 ජුනි 20 දින සහ 2022 ජුනි 28 දින අවසන් කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් පැකේජ 1 සහ 2 යටතේ ඉලක්කගත භෞතික ප්‍රගතිය වූ සියයට 87 සහ සියයට 85 ට සාපේක්ෂව ව්‍යාපෘතියට ලබා ගත හැකි වූයේ පිළිවෙළින් සියයට 58 ක සහ සියයට 57 ක භෞතික ප්‍රගතියක් පමණි. | හිඟ මුදල් ලැබෙන තුරු වැඩ කටයුතු අත්හිටුවීමට කොන්ත්‍රාත්කරුවන් පියවර ගෙන ඇත. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඉඩම් අත්පත් කර ගැනීම | ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වගන්තිය ප්‍රකාර දැන්වීම පමණක් ප්‍රසිද්ධියට පත් කර තිබුණද, පැකේජ 1 සහ 2 යටතේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර 2021 දෙසැම්බර් 31 දිනට පිළිවෙළින් සියයට 50 ක සහ සියයට 35 ක භෞතික ප්‍රගතියක් අත්කර ගෙන තිබුණි. තවද, එම ඉඩම්වල සංකීර්ණ පිඹුරු (advance tracing) සැකසීම ද එදිනට අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය. | මේ වනවිට 2 වගන්තිය ප්‍රකාර දැන්වීම ප්‍රසිද්ධ කර ඇති අතර 38(අ) වගන්තිය ප්‍රසිද්ධ කිරීමට දැනටමත් යවා ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අතුරු ගෙවීම් සහතික ලැබීම ප්‍රමාද වීම හේතුවෙන්, කොන්ත්‍රාත් පැකේජ 1 හි කොන්ත්‍රාත්කරු 2022 මැයි 12 දින සිට ඔවුන්ගේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇති බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත් පැකේජය 2 හි කොන්ත්‍රාත්කරුට සිදුවියහැකි බලපෑම් සහ අත්හිටුවීම පිළිබඳ දැනුම්දීමක් (Notification of potential impacts) 2022 අප්‍රේල් 19 දින නිකුත්කර තිබුණි. එම නිසා ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් ඉදිරියේදී අමතර පිරිවැයක් දැරීමට සිදු විය හැකි අතර ඉදිකිරීම් කටයුතු නිම කිරීමද ප්‍රමාද විය හැකිය. | එකඟ වෙමි. | අමතර වැඩ අවම කිරීම සඳහා ඉදිකිරීම් කටයුතු වේගවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ පුනරුත්ථාපන කටයුතු සම්බන්ධ විෂය පථයෙන් බැහැර වූ මස්ජිදුල් ජමායියා පාරේ තාර දැමීමේ කටයුතු සම්බන්ධ ගෙවීම සඳහා රු. මිලියන 4.4 ක මුදලක් විචලන නියෝග 01 යටතේ අනුමත කර තිබුණි. | ආරක්ෂක කමිටු ඉංජිනේරුවරයාගේ ඉල්ලීම පරිදි එම මාර්ගය දිගේ තාර දැමීමට තීරණය කරණ ලදී. | විෂය පථය තුළ අරමුදල් භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අදාල කොන්ත්‍රාත්කරුගේ වියදමින් කාර්ය සාධන ඇපකරය ලබාගත යුතුය යන කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 4.2 උප වගන්තිය යටතේ ප්‍රසම්පාදන කොන්දේසිවලට පටහැනිව, කාර්ය සාධන ඇපකර ලබා දීමේ පිරිවැය සඳහන් කිරීමට කොන්ත්‍රාත්කරුවන්ට අවසර ලැබෙන පරිදි ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයක් සඳහන් කර තිබුණි. ඒ අනුව ගෙවීම් අයිතම 1.3.2 යටතේ කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාට රු. මිලියන 19.85 ක අමතර මුදලක් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන කොන්දේසිවල (Appendix to Tender) මුදල සඳහන් කර නොමැති නිසා මෙම උප වගන්තිය අදාළ නොවේ. එබැවින් මෙය සේවා යෝජකයාගේ අවශ්‍යතාවයක් ලෙස සැලකේ. | ලංසු ලේඛන නිවැරදිව සකස් කළ යුතුය. |
| (ඈ) | 2022 මැයි 30 වන විට කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාට ගෙවීම් කර නොමැති සැප්තැම්බර් මාසයේ සිට ඇති අතුරු ගෙවීම් සහතික 12 ක වටිනාකම රු. මිලියන 2,589.24 ක් විය. ඒ අනුව ඉදිරියේදී තවත් අමතර ප්‍රමාද පොලී ගෙවීමට සිදුවිය හැක. | ව්‍යාපෘති කිරීමට අවශ්‍ය අග්‍රිම නොලැබීම ව්‍යාපෘති ප්‍රමාද වීමට හේතු විය. තවද කොන්ත්‍රාත්කරුවන් දෙදෙනාට ඉදිරියේදී තවත් අමතර ප්‍රමාද පොලී ගෙවීමට සිදුවීමේ හැකියාවක් පවතින බව සත්‍යයකි. | අනාගතයේදී ඇති විය හැකි ප්‍රමාද පොලී ගෙවීම් අවම කිරීම සඳහා විධිමත්ව කටයුතු කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි 14.7 සහ 14.8 උප වගන්තිවලට අනුව, පැකේජය 01 සහ 02 යටතේ ගෙවීම් ප්‍රමාදය හේතුවෙන් පිළිවෙලින් රු. මිලියන 52.09 ක් සහ රු. මිලියන 11.78 ක් කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රමාද පොලී ලෙස ඉල්ලා තිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් රු. මිලියන 52.09 ක් ඉල්ලා ඇති බව පිළිගනිමි. | අනාගතයේදී ඇති විය හැකි ප්‍රමාද පොලී ගෙවීම් අවම කිරීම සඳහා විධිමත්ව කටයුතු කිරීමට ක්‍රියා කළ යුතුය. |